


# මිලේච්ඡ ප්‍රහාරයට මාස 72යි...!

පෝද්දල ජයන්ත

සහාසික අපරාධවලට "දග ගෙට" නොගොස් සිටීම සඳහා සිදු කළ "බලවියරුවේ" ප්‍රහාරය......!

272කට මරු කැඳවූ, 500ක් දෙනා ආබාධිතයන් කළ, මිලේච්ඡ ප්‍රහාරයට අදට මාස 72යි.......!!

ඒ මහා අපරාධය "සිදුකර" වූයේ...... 2015 ජනවාරි 08 වැනිදා ගිලිහී ගිය රාජ්‍ය බලය යළි කෙසේ හෝ අත්පත්කර ගැනීම උදෙසාම ය. ඒ සඳහා අපරාධකාර චෞරයන් ක්‍රියාත්මක වූයේ තමන්ට යළි රට පාලනය කිරීමට නොව, තම පෙර පාලන කාලය තුළ සිදු කළ මිනිස් ඝාතන, මහා පරිමාණ දූෂණ, වංචාවලට සිපිරි ගෙට නොගොස් බේරී සිටීමේ එකම මඟ ලෙස ය. මන්ද යත් 2015 යහපාලන ආණ්ඩුවේ කුමන දුර්වලතා තිබුණ ද 2017 පමණ වන විට අධිකරණය ක්‍රමයෙන් වරදට දඬුවම ළඟා කරමින් සිටියේ ය.

2018 ඔක්තෝබරයේ සැලසුම් කළ "මෛත්‍රී, මහින්ද" රාජ්‍ය බලය පැහැර ගැනීමේ කුමන්ත්‍රණය පුරා දින 52කට පමණක් සීමාකර, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පරාජය කිරීම නොවූයේ නම්, නිසැකවම 2019 අප්‍රේල් 21 දා සිදු කළ රාජ්‍ය බලය යළි අත්පතරකර ගැනීමේ මහා මිනිස් ඝාතනය සිදු නොවන්නේ ය.

ජාතිය, ආගම විනාශ කිරීමේ භීතිය පැතිරවීම

රටේ ජාතික ආරක්ෂාව අනතුරුදායක ලෙස බිංදුවට වැටී ඇතැයි ද සිංහල, බෞද්ධ, කතෝලික ජනයාගේ ඉදිරි පැවැත්ම "මුස්ලිම් ජාතිය" විසින් අවසන් කරනු ඇතැයි යන තැති ගැන්වෙන මහා "භීතියක්" මවා පා 2015දී ගිලිහුණු රාජ්‍ය බලය යළි අත්පත්කර ගැනීම මේ මහා අපරාධයේ මුඛ්‍ය පරමාර්ථය විය.

ඊට පෙර මේ භීතිය රට තුළ ක්‍රමයෙන් තහවුරු කිරීම පිණිස වඳ කොත්තු, වඳ යට ඇඳුමෙන් පටන් ගෙන කහකඩ තක්කඩීන් ලවා තැන තැන ජාතිවාදී ගැටුම් නිර්මාණය කරමින් ද සිංහල ජාතිය වඳ කිරීමේ වඳ සැත්කම් කුමන්ත්‍රණයක් ඇති බවට පොළොව පැළෙන බොරුවක් සමාජගත කළේ ය.

තමන්ගේ ජාතිය, ආගම වෙනත් ජාතියක් විසින් වනසා දැමීමේ කුමන්ත්‍රණයක් ක්‍රියාත්මක වෙමින් තිබෙන බවට නිරන්තරයෙන් මන්ත්‍රයක් මෙන් ජප කරන විට ඕනෑම ජාතියක මිනිස්සුන් ඊට සංවේදී වීම නොවැළැක්විය හැකි ය. යළි රාජ්‍ය බලය අත්පත්කර ගැනීමේ කුමන්ත්‍රණයේ යෙදුණු චෞරයෝ උන්ගේ බලවියරුව තහවුරු කර ගැනීමට මිනිස් මනසේ ඉතා සංවේදී තැන ඒ අයුරින් අතික්‍රමණය කළේ ය.

"ජාතික ආරක්ෂාව බිංදුවයි. සිංහල ජාතිය අනතුරේ....! අපි රට භාර ගන්නම්"

පාස්කු දින ප්‍රහාරය දියත් කරවා ඒ චෞරයෝ කාලයක් තිස්සේ රටේ ජනතා සිත්සතන් තුළ නිර්මාණය කළ මහා භීතිය 2019 අප්‍රේල් 21 ඔප්පු කර පෙන්වී ය. පාස්කුදින මහා අපරාධය සිදුවූ විගස හැංගිමුත්තමෙන් වහා එළියට පැන රටේ "ජාතික ආරක්ෂාව මහා අනතුරක වැටී ඇතැයි ද මේ දැවැන්ත බේදවාචකයෙන් රට බේරා ගැනීමට අපට හැකියාව තිබෙනවා" යැයි ප්‍රකාශ කිරීමම දඩයම කාගේද යන්න පැහැදිලි විය.

චෞරයන්ගේ සැළසුම සාර්ථක කර ගනිමින් 2019 නොවැම්බරයේ බහුතර සිංහල බෞද්ධ ඡන්දයෙන් යළි රාජ්‍ය බලය ලබා ගැනීම මේ අපරාධයේ කූටප්‍රාප්තිය යි. බලය ඩැහැගත් වහාම උන්ගේ පළමු රාජකාරිය වූයේ පාස්කු-දින ප්‍රහාරයේ අපරාධ පරීක්ෂණ විමර්ශකයෝ සියයකට වැඩි පිරිසක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් විතැන් කිරීම යි. එදා සිට 2024 සැප්තැම්බර් දක්වා එකී අපරාධ විමර්ශන හමස් පෙට්ටියේ බහාලූහ.

අලුත් ආණ්ඩුව බලයට පත්වූයේ මේ සහාසික අපරාධය සිදු කර වූ අපරාධකරුවන් නීතිය ඉදිරියට ගෙන ඒමේ ප්‍රතිඥාව පෙරදැරිවය. දැන් ඒ පිළිබඳ විධිමත් විමර්ශන අරඹා ඇති බව පෙනෙන්නට තිබේ. 2019 රාජ්‍ය බලය අත්පත්කර ගැනීමෙන් පසු උන්ගේ අපරාධවලට අදාළ බොහෝ සාක්ෂි විනාශ කර ඇති බව තහවුරු වී තිබේ. යළි විමර්ශන ආරම්භ කරමින් එකී විනාශ කරන ලද සාක්ෂි ද නැවත ඒකරාශි කිරීම ද වත්මන් විමර්ශකයන්ට අභියෝගයක් වී තිබේ. අපරාධකරුවෝ භූමිතෙල් ගෑවුණු ගැරඬින් සේ හතර අත දුවමින් සිටින්නේ ඒ නිසා ය.

එකී අභියෝගයද භාර ගනිමින් පාස්කුදින සහාසික අපරාධයේ ඇත්ත අපරාධකරුවෝ නීතිය ඉදිරියට ගෙන එන දවස ඉහත අපරාධයේ සෘජු වින්දිතයෝ පමණක් නොව, රටේ අති බහුතරයක් නොඉවසිල්ලෙන් බලා සිටින වග ජනාධිපති ප්‍රමුඛ සමස්ත ආණ්ඩුවම තරයේ දැන සිටිය යුතු ය.

## fb මුහුණුපොතේ තිබුණි මෙසේ

## සදාතනික පෙම් කුසුම්







හේෂාන් රූපසිංහ

"අවුරුදු ෂූට් එකක් කරන් නැද්ද? ඔන්න කළා.

ඒක එක විදුහල්පති කෙනෙකුගෙයි එක ගුරුවරියකගෙයි අවුරුදු 56ක ආදර කතාවක්.

ඒක අවුරුදු 56ක ලස්සන ආදර කතාවක්. ඒ මගේ සීයගෙයි ආත්තම්මාගෙයි ආදර කතාව. දෙන්නගෙ වයස අවුරුදු 86යි; 83යි. තාමත් දෙන්නම ආදරෙන් ඉන්න වාසානාවන්ත ආදරයක්. දෙන්නම හිටපු ගුරුවරු දෙන්නෙක්. එයාලගේ ඉස්සර කාලේ කතා තාමත් අපි එක්ක කියනව සතුටින් අතීතය මතක් කරන ගමන්.

'බලන්නකො පුතා මාව රවට්ටලනෙ අල්ල ගත්තේ. කොන්ඩ කරල ගෙතුවම මෙන්න දිග. පස්සෙ තමයි දන්නෙ ඒ බොරු කොන්ඩයක්'

සීයා අත්තම්මව චුට්ටක් අවුස්සන්න එහෙම කියනවා. ඉස්සර අත්තම්මලගෙ තරුණ කාලේ කොන්ඩේ දිගට පේන්න හවරි දාලලු ගොතන්නෙ. සමහර දවස් වලට සීයා අත්තම්මට කියන්නෙ නුවර හවලතා කියලා. එයාලා තාමත් නිතරම ආදරෙන් විහිළුවෙන් ඉන්න දෙන්නෙක්.

සීයා මොණරාගල අත්තම්මා නුවර. ළඟ පාත ආදරයක් නෙවෙයි.

අත්තම්මගෙ අයියා කෙනෙක් මෙහේ බකිණිගහවෙල ඉස්කෝලෙක ප්‍රින්සිපල් වෙලා ඉඳලා. ඒ කාලේ අත්තම්මා උඩරට නැටුම්වලට දක්ෂලු. 'එහේ හිටියොත් උඹ නට නට ඉන්නවා. ඉගෙන ගන්නෙ නෑ' කියල අත්තම්මගෙ අයියා අත්තම්මව බකිණිගහවෙල ඉස්කෝලේට එක්ක ඇවිත්. ඒ කාලේ සීයා ගුරුවරයෙක් වුණ අලුතලු. ක්‍රීඩා වැඩවල විනිශ්චය මණ්ඩලයට වෙන ඉස්කෝලෙක ඉඳලා සීයලා අත්තම්ම ඉන්න ඉස්කෝලෙට ඇවිත් දැකල තමයි ඒ ලස්සන ආදර කතාව පටන්ගෙන තියෙන්නෙ. ඒ 1961දී.

එදා ඉඳල අද වෙනකල් තාමත් ආදරෙන් දෙන්නම එකට ඉන්න එක නිසාම තමයි මම 'වාසනාවන්ත ආදර කතාවක්' කිවුවෙ.

අද මම දෙන්නව ෆොටෝ ගන්න යමු කිවුවම උදේ මාතර ඉඳල දුර ගමනක් ඇවිල්ලත් මහන්සිය ගැන ගානක් නැතුව දෙන්නම හරි සතුටින් කැමති වුණා. මේ වගේ වැඩවලට හරි කැමතියි ඒ දෙන්නම.

මම ෆොටෝවලට උම්ම එකක් දෙන්න කිවුවම 'අවුරුදු හැටකින් පුතේ මේ දෙන්නෙ' කියනව සීයා විහිළුවෙන්.

අපි හැමෝම අපේ පවුලේ දැක්ක වාසනාවන්තම, ලස්සනම, වයසින් වැඩිම ආදරය අපේ සීයයි අත්තම්මයි.

අපේ සීයා අඳින්නෙ අපේ ජාතික ඇඳුම; සුදු සරමයි ෂර්ට් එකයි.


මට හිතුණා සීයට කලිසමක් අන්දන්න. ඉතින් සීයගෙ ඇඳුම් ටික සංජය අයියට කතා කළාම 'එන්න මල්ලි, වැඩේ කරමු' කියලා මට ඉක්මනින්ම ඇඳුම ලෑස්ති කර ගන්න පුළුවන් වුණා. thank you Sanjaya අයියේ. ඒ වගේම ගොඩක් පින්. සීයා කලිසමක් කෝට් එකක් ඇන්දේ අවුරුදු 60කට පස්සෙ. ඒ ආදරවන්තයාගේ නම සරත් දිසානායක. වයස අවුරුදු 86යි. එයාගේ ආදරවන්තිය තමයි වයස අවුරුදු 83ක් වුණු පියනන්දා විජයලතා

රන්සර බණ්ඩාර

කලක් වියැළුණු පසුව
මල් පවා වහා ගිනි
ඇවිළෙන සුළුයි
ඔබට මේ දැනෙන්නේ..
ආදරය පිලිස්සුණු කර
ගඳයි...















යටිසිත follow

ඒ සුන්දර මිනිසුන් සමුගනිමින් සිටී...
ඒ අපූරු පරපුර මිය යමින් සිටී......
මහා යාන වාහන... ස්මාට් දුරකතන නොව ..
රූපවාහිනී හා විදුලිය ද නොමැතිව උන් ජීවත් වූහ..
අපේ පරපුර මෙන් ..
මහ ඉහළට ඉගෙන ගැනීමට,
ලස්සනම කෙනා වීමට..
ලොකුම කතාව කිරීමට...
උන්ට වෙලාව තිබුණේ නැත.
තාප්පවලින් වටකොට මහා මාලිගා තැනීමට....
නවීනතම වාහනය ගැනීමට..
ලස්සනම ඇස් ඇති සෙල්ෆිය ගැනීමට..
උන්ට ඇවැසි වූයේ නැත.
රෑ වෙනතුරු
වත්තේ..පිටියේ..
තැන්නේ .. කුඹුරේ.. තිරිඟු යායේ..
ඔට්ටු වූ උන් ..
මැදියම වෙනතුරු...
ඇඳුම් මැසූහ.. වට්ටි පෙට්ටි විවීය..
ඒ මැසූ ඇඳුමෙන් සරලව සැරසුණු උන්ට..
මහා නිර්මාණකරුවන්ගේ ලාංජන ඇති..
අමුතු ඇඳුම් ඇවැසි නොවීය.
ලෙඩට දුකට චැනල් කරන්නට..
උන්ට කිසිවකු නොසිටියහ.
ගහට කොළට.. සතා සීපාවාට..
ඇළට දොලට උන් සැබැවින්ම ආදරේ කළහ..
කුරුල්ලන් ලේනුන් උන්ගේ අත් උඩට එන්නට
කිසි විට බය නොවූහ.
එබැවින් උන්ට ..
ඔක්සිජන් සඳහා මරා ගන්නට ..
මූණු ආවරණ දා හැංගෙන්නට ..
ඇවැසි නොවීය..
ගේ ඇතුළට නළ ජලය නොලැබූ උන්..
ඇළට දොලට, ලිඳට වැවට..
පාරේ පයිප්පයට ගොස්
වතුර ගෙන ආහ..
මැක් ඩොනල්ඩ්.. කෙන්ටකි නොදත් උන්
අල ගෙඩියකින්.. සහල් මිටකින්... තිරිඟු කරලින්
සෑහීමකට පත් වූහ..
උන් අපේ පරපුරට ඇළ දොල භාර දෙද්දී..
ඒවා ප්ලාස්ටික් කුණුගොඩවල් නොවීය..
වැව් මුහුදු භාර දෙද්දී,
කුණු වතුරෙන් පිරී නොතිබීය..
වත්ත පිටියේ ..
කුරුල්ලො ගී ගැයූහ..
අද අපි ඊළඟ පරපුරට භාර දෙන කුණු ගොඩ දැක
උන් කඳුළු පෙරූහ..
යුද්ධ.. සාගිනිවලට මූණ දුන්
උන්..
මහ උන්ට රැවටුනි..
මේ පරපුර මිය යමින් පවතී..
මට මගේ පරපුර ගැන ඇත්තේ කලකිරීමකි.
උඹලාගේ පරපුර ගැන ඇත්තේ ආදරයකි.
ලියන්නට තව බොහෝ දේ තිබුණත්..
කියවන උඹට ...
නොලියූ දේ දැනුණු බව දනිමි.

## ජනාධිපති හෙලිකොප්ටරේකින් ගමනක් යනවෝ...!



වජිර ද සිල්වා

**සී ලාංකිකයෝ :** මෙන්නෝ අපේ සල්ලි නාස්ති කරනෝ.... කලින් හෙලිකොප්පරවල ගිය උන්ට හිනා උනා නේතෝ...දැන් මෙයත් යන්නෙ එහෙමදෝ...යැයි...යැයි...යැයි

ජනාධිපති කාර් එහෙකින් යනවා....

**සී ලාංකිකයෝ :** පිස්සුද මන්දා මෙහෙම වෙලාව නාස්ති කර කර පාරවල් ගානේ රස්තියාදු වෙන්නෙ...බොරු සෝබනේනෙ.. ඕනවට වඩා සරල වෙන්ඩ යනවනේ... තනතුරේ ගෞරවේ තියාගෙන හෙලිකොප්පරේකින් යන්ඩෝනනේ...යැයි...යැයි...යැයි

ජනාධිපති දළදා ප්‍රදර්ශනය විවෘත කරලා මුලින්ම වඳිනවා....

**සී ලාංකිකයෝ :** VIP නෑ කිව්වා නේත....එයා කොහොමද එහෙම මුලින්ම ගිහින් වඳින්නෙ... හරිනං එයත් පෝලිමේ යන්ඩෝනනේ...යැයි...යැයි...යැයි

බැරිවෙලාවත් ජනාධිපති පෝලිමේ ගිහින් වැන්දානං...

**සී ලාංකිකයෝ :** කාටද බං මේ බොරු කරන්නෙ... ඕනවට වඩා සරල වෙන්ඩ යනවනේ... ජනාධිපති තනතුරේ ගෞරවේ තියන්ඩ දන්නෑනේ... බොරු සෝබන නැතුව රටේ නායකයා මුලින්ම වැන්දානං හරිනේ... යැයි...යැයි...යැයි

ජනාධිපතිගෙ අම්මා පෝලිමේ ගිහින් දළදා වඳිනවා...

**සී ලාංකිකයෝ :** අර වයසක අම්මව පෝලිමේ යවන්නෙ පිස්සුනේ...මං ජනාධිපති උනානං කවදාවත් මගෙ අම්මව පෝලිමේ යවන්නෑ...එහෙම දෙයක්වත් කරන්ඩ බැරි ජනාධිපතිකමෙන් වැඩක් තියෙනවද...රටේ අනිත් අම්මලටත් ඔය සැලකිල්ලම තමා... යැයි...යැයි...යැයි

බැරිවෙලාවත් ජනාධිපතිගෙ අම්මා පෝලිමේ ඉන්නැතුව වැන්දානං...

**සී ලාංකිකයෝ :** VIP නෑ කිව්වා නේත... එයාගේ අම්මා විතරද අම්මා...පෝලිමේ ඉන්න අනික් වයසක අම්මලා අම්මලා නෙවෙයිතේ... යැයි...යැයි...යැයි

සිරි ලාංකිකයෝ යනු කිසිදාක සතුටු කළහැකි ජාතියක් නෙවෙයි.

2025 අප්‍රේල් 22 අඟහරුවාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.